**හිගුරක්ගොඩ ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 11 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජුලි 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

-------

මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂයට සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-------------------------

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු. 308,518,884ක් වූ අතර ස්ථාවර වත්කම් ලේඛණයෙහි සඳහන් අයිතමයන් 30කට අදාලව වටිනාකම් දක්වා නොතිබීම හේතුවෙන් හා වසර ගණනාවකින් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර, එම වටිනාකම් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන්, 2014 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි වලට අදාල වටිනාකම් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) දේශිය ණය සහ සංවර්ධන අරමුදල මගින් මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා ලබාදුන් ණය මුදලින් 2014 දෙසැම්බර් 31 දිනට රු. 25,469,046 ක ණය ශේෂයක් පවතින නමුත් මූල්‍ය ප්‍රකාශනවල රු. 21,178.135 ක ලෙස දක්වා තිබීමෙන් ශේෂ පත්‍රයේ ණය ප්‍රාග්ධනය රු. 4,290,911 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) දේශීය ණය සහ සංවර්ධන අරමුදල මඟින් මාර්ග නඩත්තු යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා ලබා දුන් ණය මුදල වෙනුවෙන් 2011 වර්ෂයේ හිඟ ණය පොලිය හා වාරික මුදල වූ රු. 909,789 ක ශේෂය ශේෂ පත්‍රයේ ණයහිමියන් යටතේ නොදැක්විම හේතුවෙන්, වර්ෂයේ ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙතින් 2012 වර්ෂයේදි ලබාගත් ණය මුදල් සඳහා ණය ලේඛනයට අනුව 2013 වර්ෂය අවසානයට හිඟ පොලි හා වාරිකවල එකතුව රු. 1,568,764 ක් වුවද, ණයහිමියන් ලෙස රු. 1,714,435 ක් ලෙස දක්වා තිබීමෙන්, ණයහිමි වටිනාකම රු. 145,671 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2013 වර්ෂයේ අවසානයට හිඟ ණය, ණය වාරික හා පොලී වටිනාකම රු. 5,265,105 ක් වුවද, ණයහිමි වටිනාකම ලෙස රු. 6,214,335 ක් ලෙස ගිණුම්ගත කිරිම හේතුවෙන් ණයහිමි වටිනාකම රු. 949,230 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ස්ථාවර වත්කම් ලේඛණයේ හිගුරක්ගොඩ ළමා ක්‍රීඩාංගනයෙහි පිහිටි නව පොළ භූමියෙහි තක්සේරු වටිනාකම ලෙස රු. 9,200,000 ක් දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම ලෙස රු. 8,058,150 ක් දක්වා තිබිමෙන්, රු. 1,141,850 ක නොසැසදීමක් නිරීක්ෂණය විය.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 371,292,168 ක් වූ ගණුදෙනු විගණයේදී සතුටුදායක ලෙස සත්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්

-----------------------

නිළධාරීන්ට ගෙවූ රු. 84,641ක අත්තිකාරම් ශේෂයක්, පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර මෙම ශේෂය පෙර වර්ෂ වලදී ද නොපියවා ඉදිරියට ගෙන එමින් පැවතින.

1.3.4 අනුකූල නොවීම

-------------------

පහත දැක්වෙන නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරික්ෂණය විය.

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | ---------------------------------------- | ------------------- |
| (අ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනත | මාසික දළ වැටුප රු. 25,000 ඉක්මවන සේවකයින්ට ගෙවන වේතනයෙන් රු .25 බැගින් වූ මුද්දර ගාස්තුවක් අයකර, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යැවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ සේවකයන් 67 දෙනෙකුට අදාලව අයකළ යුතු වූ රු. 9,750 ක මුද්දර ගාස්තු අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන) රීති<br>-------------------------------------------- | |
| (i) | රීති 65 | කර්මාන්ත බදු ගෙවීම් පැහැර හරින ලද අයගේ නාම ලේඛනයක් සකස් කර නොතිබුණි. |
| (ii) | රීති 67 | වාර්ෂිකව සිදු කරනු ලබන සමීක්ෂණ මගින් වෙළඳ ස්ථාන සහ කර්මාන්ත ප්‍රමාණයන්ගේ අඩු වැඩිවීම් ඇතුළත්ව සකසන ලද ලැයිස්තුවක් පදනම්ව, වෙළඳ බලපත්‍ර ගාස්තු හා කර්මාන්ත බදු අයකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාලව එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (iii) | රීති 203, 214 හා 218 | සභාවේ දේපල සම්බන්ධව පූර්ණ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-------------------------------------- | |
| | මු.රෙ. 571(2) | තැන්පත් කාලය වර්ෂ 02 ක් ඉක්මවා තිබුණු රු .651,461 ක් වූ ඉකුත් තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

**02.** **මූල්‍ය සමාලෝචනය.**

-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,588,639 ක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,289,651 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම්.

------------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිගය |
|---|---|---|---|
| | '000 | '000 | '000 |
| (i) වරිපනම් හා බදු | 2,564 | 1,769 | 2,080 |
| (ii) බදු කුලී | 13,009 | 4,533 | 1,168 |
| (iii) බලපත්‍ර ගාස්තු | 4,424 | 3,530 | - |
| (iv) වරෙන්තු හා දඩ | 8,700 | 6,154 | 5,697 |
| (v) වෙනත් ආදායම් | 14,429 | 11,948 | 15,466 |

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1. නිෂ්කාර්ය / ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

(අ) යුධ හමුදාව විසින් භාවිතා කර නැවත සභාව වෙත භාර දී ඇති කැබ් රථයක් සහා භූමියේ වර්ෂ ගණනාවක සිට ගාල්කර ඇතත්, මෙම කැබ් රථය අලුත් වැඩියා කර භාවිතයට ගැනීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) රු. 225,000/-ක වටිනාකමක් දක්වා ඇති අලුත් වැඩියාවකින් පසු භාවිතයට ගතහැකි රෝද හතරේ ට්‍රැක්ටරයක් වර්ෂ 05 ක පමණ කාලයක සිට භාවිතා නොකර සහා භූමියේ ගාල්කර තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

(අ) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව සඳහා පසුගිය වසර වලදී දේශීය ණය හා සංවර්ධන අරමුදල මඟින් මල අපවහන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය, මාර්ග නඩත්තු යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ ව්‍යාපෘතිය සහ මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සිවිල් වැඩ) යන ව්‍යාපෘති සඳහා ලබා දී තිබුණු ණය මුදල් වලට අදාල වාරික හා පොලී මුදල් නිසි පරිදි ගෙවීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ලබා දුන් ණය ගෙවීමේ ප්‍රගතිය පිළිබඳව සහ හා ණය ආපසු ගෙවීමේ ශක්‍යතාවය පිළිබඳ සොයා බැලීමකින් තොරව, දිගින් දිගටම සභාවට ණය ලබාගැනීමට කටයුතු කර තිබුණි.

(ආ) 2014 වර්ෂයේ පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණය අනුව භාණ්ඩ වර්ග 90 ක ඌණතාවයක් නිරීක්ෂණය වී තිබුණද, එම ඌණතාවයන් පිළිබඳව සොයා බලා, ප්‍රාදේශීය සභා රීති 204 ප්‍රකාරව වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) මින්නේරිය පුස්තකාලයේ 2006 වර්ෂයට පෙර සාමාජිකයන් විසින් රැගෙන ගොස් ඇති, මෙතෙක් භාරදී නොමැති පොත් සංඛ්‍යාව 692 ක් විය. පොත් රැගෙන ගිය සාමාජිකයින්ගෙන් පොත් නැවත ලබාගැනීමට හෝ අලාභ අයකර ගැනීමට හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) වර්ෂ 07ක පමණ කාලයක සිට අක්‍රියව පවතින බැංකු ගිණුමකට අදාල බැංකු ප්‍රකාශයට අනුව එහි ශේෂය රු. 1, 724 ක් වුවද, මූල්‍ය පුකාශනවල එම ගිණුමෙහි ශේෂය රු. 14,168ක් ලෙස දක්වා තිබුණි. මෙම වෙනසට හේතුව අනාවරණය කර ගැනීමට නොහැකි වූ අතර මෙම බැංකු ගිණුම වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

3.3 අයවැය පාලනය

--------------------

සභාවේ ආදායම් ප්‍රභවයන් නිසි ලෙස පුරෝකථනය කිරීමකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම හා ඇස්තමේන්තුගත ආදායම් විෂයයන් අතර සියයට 20 සිට සියයට 68 දක්වා විචලනයක් නිරීක්ෂණය විය.

3.4 සණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශය තුළ විධිමත් කසල කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ප්‍රදේශයේ රැස්කරන කසල, අවිධිමත්ව කැලෑබද ප්‍රදේශයකට බැහැර කෙරෙන අතර එම කැලිකසල වන සතුන් විසින් ආහාරයට ගැනීමෙන් එම වන ජීවීන්ගේ ජීවිතවලට තර්ජනයක් එල්ලවී ඇති බව නිරික්ෂණය විය.

3.5 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන්හි සභාව තුළ අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණු අතර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින්ද ප්‍රමාණවත් විගණනයක් සභාව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

4. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) වාහන උපයෝජනය